දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-03/03/2019

ඔබේ අංකය / உமது இல. / Your No.:

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla


දිනය / திகதி / Date: 2020.01. 01

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2020

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අනුමත බඳවා ගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථා වල සඳහන් "පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය " සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම</u>**

යථෝක්ත කාරණයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් තීරණයන් ලබාදී ඇත.

01. අනුමත බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් වල ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා සහ සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමේ කාර්යයන් සඳහා සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන **"පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම"** යන අවශ්‍යතාවය වෙනුවට **"රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය"** යන අවශ්‍යතාවය ඇතුලත් කරමින් එම බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සංශෝධනය කරනු ලැබේ.

02. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කල දිනයේ සිට වසර පහක (05) කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කල දිනයේ සිට වසර දෙකක (02) කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25.2 වගන්තිය යටතේ දක්වා ඇති ලඝු විනය ක්‍රියා පටිපාටිය යටතේ විනය දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කල දිනයේ සිට වසරක කාල සීමාවක්ද, ගතවනතුරු, බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් අනුව සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමට හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබාදෙනු ලබන ශ්‍රේණි උසස්වීමකට හෝ නුසුදුසු නිලධාරියකු ලෙස සැලකිය යුතුය.

03. සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ සිදු කරනු ලබන බඳවා ගැනීමකදී හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබා දෙනු ලබන ශ්‍රේණි උසස්වීමකදී හෝ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනයකට නිලධාරියකුගේ සුදුසුකම් පරික්ෂා කර ඉදිරි දිනයක සිට බලාත්මකවන පරිදි බඳවාගැනීම හෝ උසස්වීම ලබාදෙනු ලබන අවස්ථාවකදී, නිලධාරියා සුදුසුකම් පරික්ෂාකරනු ලබන දිනයේ සිට බඳවාගැනීම හෝ උසස්වීම ක්‍රියාත්මකවන දිනය දක්වා කාලය තුලදී විනයානුකූලව දඬුවමක් ලබා ඇත්නම් ඉහත II හී සඳහන් විධිවිධානයන් එම බඳවාගැනීම හෝ උසස්වීම ක්‍රියාත්මක වන දිනයට අදාළ කර ගැනීමට සහ එම කාල සීමාවතුල සිදුකල වරදක් සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත්නම් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 14.12 හී සඳහන් විධිවිධාන අදාළ කර ගැනීමට කටයුතු කළ යුතුය.

04. තවද, නිලධාරියකුගේ සතුටුදායක සේවා කාලය ගණනය කරනු ලබන සියලුම අවස්ථාවන්වලදී රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 186 (ii) අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමට කටයුතු කල යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඇති බව වැඩිදුරටත් දන්වමි.

05. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් 2020.01.01 දිනයේ සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.